**උක් පර්යේෂණ ආයතනය - 2025**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උක් පර්යේෂණ ආයතනයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ආයතනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 118 ඡේදය අනුව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ වෙනම වත්කම් කාණ්ඩයක් ලෙස ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති පිරිවැය රු.3,142,674ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 118 ඡේදය ප්‍රකාරව අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගත යුතු රු.3,142,674ක පරිගණක මෘදුකාංග ශේෂ පත්‍රයේ වෙනම අස්පෘෂ්‍ය වත්කම් කාණ්ඩයක් යටතේ ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 118 ඡේදය අනුව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ වෙනම වත්කම් කාණ්ඩයක් ලෙස හඳුනාගෙන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ආයතනයට අයත් වගා බිම්වල පවතින ඵලදාව ලැබෙන සහ පැල පොල් ගස් 310ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 13 ඡේදය ප්‍රකාරව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබීමෙන්, එම ජීව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් වී තිබුණි. | පොල් ගස් ගණනය කර එහි වටිනාකම තක්සේරු කර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 13 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 13 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 13 ඡේදය හා ප්‍රමිත අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව වගා බිම්වල පවතින ඵලදාව නෙළන පොල්ගස් 248ක් හඳුනාගෙන ක්ෂය කළ යුතු වුවද, එම පොල්ගස් සඳහා ක්ෂය වියදම් ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් (පොල් ගස්) වල තක්සේරු වටිනාකම් මූල්‍ය ප්‍රකාශණ තුල පෙන්වීමට කටයුතු කිරීමේදී ඊට අදාල වන ක්ෂය අනුපාත තීරණය කර ක්ෂය වියදම රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ගිණුම්ගත කරන බව. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පොල්ගස්වල ක්ෂය වියදම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් අඩමාන ණය වෙන් කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණු අතර, ණයගැති ශේෂවල වයස් විශ්ලේෂණය හා ණය අයකර ගැනීමේ හැකියාව සැලකිල්ලට නොගෙන, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.18,670,299ක වෙළඳ ණයගැති ශේෂය මත පොදුවේ සියයට 5ක් ලෙස රු.933,515ක අඩමාන ණය වෙන්කර තිබුණි. ඒ අනුව, මාස 6කට අඩු සහ වසර 5කට වැඩි ණය ශේෂ සඳහාද එකම අනුපාතයකින් අඩමාන ණය වෙන්කර තිබුණි. | 2026 වර්ෂයේ සිට අඩමාණ ණය වෙන් කිරීම | ණයගැති ශේෂවල අයකර ගැනීමේ හැකියාව තක්සේරු කර, ඒ අනුව අඩමාන ණය වෙන් කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජංගම වත්කම්වල එකතු වටිනාකම් පිළිවෙලින් රු.22,024,539ක් සහ රු.24,164,076ක් වැඩියෙන් ද ජංගම නොවන වත්කම්වල එකතු වටිනාකම් පිළිවෙලින් රු.22,024,539ක් සහ රු.24,164,076ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2024 සහ 2025 වර්ෂ වල ජංගම හා ජංගම නොවන වත්කම් පිළිවෙලින් රු.22,024,539ක් සහ රු.24,164,076ක් ලෙස එකතු වටිනාකම් දෝෂ සහිතව මුද්‍රණය වීම 2026 වර්ෂයේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන රේඛීය අයිතමවල එකතු වටිනාකම නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගත වී තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත් 5 ක් සහ 2026 වර්ෂයේ ගිවිසුම්ගත වී තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත් 2ක් වෙනුවෙන් මුලු ඇස්තමේන්තු වටිනාකම වූ රු.9,239,151ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපචිත කර කෙරීගෙනයන වැඩ ගිණුමට හර කර තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරීගෙනයන වැඩ (Work in Progress) සහ ජංගම වගකීම් රු.9,239,151ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි | ඉදිරි මූල්‍ය වර්ෂවලදී ඉංජිනේරු සහතික බිල්පත් වටිනාකම් ලබාගැනීමෙන් අනතුරුව එම වටිනාකම් උපචිත කිරීමට කටයුතු කරන බව. | ඉංජිනේරු සහතික මත තහවුරු කළ වැඩ වටිනාකම් පමණක් උපචිත කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ (Work in Progress) පැවති රු.11,949,954ක ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබීමෙන් එම වටිනාකමින්, ජංගම වත්කම් වැඩියෙන්ද ජංගම නොවන වත්කම් අඩුවෙන්ද දක්වා තිබුණි. | කෙරීගෙන යන වැඩ(Working Progress) ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරන බව. | ඉදිකිරීම් යටතේ පවතින කෙරීගෙන යන වැඩ ජංගම නොවන වත්කම් ලෙස නිවැරදිව වර්ගීකරණය කර වාර්තා කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට කොළඹ කාර්යාල ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කර එහි නව තක්සේරු වටිනාකම ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, එම නව තක්සේරු වටිනාකම මත වාර්ෂික ක්ෂයවීම ගණනය කිරීමේදී ගොඩනැගිල්ලේ ඉදිරි ඵලදායී ජීව කාලය වෙනුවට සමස්ත ඵලදායී ජීව කාලය පදනම් කරගෙන තිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂයවීම රු.360,044කින් අඩුවෙන් ගණනය කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගොඩනැගිලිවල ශුද්ධ පොත් වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රත්‍යාගණනය කරන ලද කොළඹ කාර්යාල ගොඩනැගිල්ලෙහි ක්ෂය වටිනාකම ඉදිරි ඵලදායී ජීව කාලය මත පදනම්ව ගණනය කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිල්ලේ ක්ෂයවීම ඉදිරි ඵලදායී ජීව කාලය පදනම් කරගෙන නිවැරදිව ගණනය කර, ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගිණුම් ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ආයතනය විසින් භාවිතා කරන හෙක්ටයාර් 207.363ක් වූ ඉඩම් කැබලි 3ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණු බැවින් දේපල පිරියත හා උපකරණවල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි | උක් පර්යේෂණ ආයතනය භාවිතා කරන නමුත් අයිතිය සම්බන්ධ ගැටළු තිබෙන උඩවලව, දෙනියාය, සියඹලාණ්ඩුව යන මධ්‍යස්ථාන ඉඩම් වල ද අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශණවල ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි නිර්ණායක අනුව දේපල, පිරියත හා උපකරණ ලෙස නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ආයතනයේ අරමුදල් මගින් මිලදී ගෙන තිබුණු රු.10,932,946ක ස්ථාවර වත්කම් මත සමාලෝචිත වර්ෂයට අදාළව ගණනය කර තිබුණු රු.574,271ක ක්ෂය, ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ විලම්භිත අදායම් රු.574,271ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි | මෙම ප්‍රාග්ධන ආදායම් සහ වියදම් වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම් සහ වියදම් ලෙස ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සදොස් ලෙස හදුනාගත් පුනරාවර්තන ආදායමේ බලපෑම අදාළ ගිණුම්වලින් ඉවත් කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ වියදම් නොකර භාණ්ඩාගාරය වෙත ආපසු ප්‍රේෂණය කර තිබූ රු.12,905,803ක ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශන තුළ විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විලම්භිත ආදායම් එම වටිනාකමින් වැඩියෙන්ද වගකීම් එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි. | මහා භාණ්ඩාගාරයට නැවත ප්‍රේෂණය කරන ලද රු.12,905,803ක ප්‍රාග්ධන මුදල් කල්තැබූ ආදායම් යටතේ වාර්තා කිරීමේ දෝෂය නිවැරදි කරන බව. | භාණ්ඩාගාරයට ආපසු ප්‍රේෂණය කළ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදි ගිණුම් යටතේ හදුනාගෙන, මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |
| (ඌ) | පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.313,220,747ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ වියදම් නොකර ඉතිරිව භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබූ රු.13,902,891ක් ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුළ වියදම් කිරීමට නොහැකි වූ රු.13,902,891ක මුදල 2026 වර්ෂයේ පෙබරවාරි මස නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද අතර එම මුදල වර්ෂයේ ආදායමක් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කරන බව. | වැරදි ලෙස හඳුනාගත් ආදායම ගිණුම්වලින් ඉවත් කර, සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ වගකීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ආරක්ෂක සේවා සපයන ආයතන දෙකක් සඳහා ගෙවිය යුතු රු.3,227,328ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන්, වර්ෂයේ ඌනතාවය සහ ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ආරක්ෂක සේවාව සඳහා ගෙවිය යුතුව තිබූ රු.3,227,328ක මුදල ජංගම වගකීම් ලෙස හඳුනා නොගැනීමේ වරද නිවැරදි කරන බව. | ගෙවිය යුතු වියදම් නිසි පරිදි හඳුනාගෙන, බලපෑමට ලක් වූ ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයට අදාළ සේවක පාරිතෝෂිත වියදම රු.35,967,987ක් වුවද එම වටිනාකමෙන් රු.34,585,689ක් ඉකුත් වර්ෂ ඌනතාවයට ගැලපීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත වියදම රු.34,585,689කින් අඩුවෙන් වාර්තා කර තිබුණි. | පෙර වර්ෂ වලට අදාලව වැඩි වන ලද රු.32,370,628.31ක පාරිතෝෂික වෙන් කිරීම රඳවාගත් ලාභ වලට ගැලපීම ලෙස නිවැරදි විය යුතු අතර එම අගය පමණක් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පාරිතෝෂිත වියදම් සම්බන්ධයෙන් සදොස් ලෙස ගිණුම්ගත කර ඇති ගනුදෙනු හඳුනාගෙන, එමගින් බලපෑමට ලක්වූ අදාළ ගිණුම් ශේෂයන් නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ඉකුත් වර්ෂයේ මිලදී ගෙන භාවිතයට නොගෙන තිබූ රු.2,493,635ක් වටිනා ගැල්වනයිස් බට තොගය ප්‍රාග්ධනිත කිරීමේ දෝෂය නිවැරදි කිරීමේදී, එහි මුළු පිරිවැය ඉකුත් වර්ෂයේ වියදමක් ලෙස සදොස් ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම තොගය ඉදිකිරීම් සඳහා භාවිතා කර නොතිබීම හේතුවෙන්, රඳවාගත් ඉපයුම් සහ කෙරීගෙන යන වැඩ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ගැල්වනයිස් බට තොගය පෙර වර්ෂයට අදාලව නිවැරදිව ගැලපුම් කර ඇති බව සහ එම බට තොගය ජංගම වත්කම් ලෙස 2025.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගතව ඇති බව. | භාවිතයට නොගත් ගැල්වනයිස් බට තොගය නිවැරදිව ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

**1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ අරමුදල් භාවිතා කර සේවකයින් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 06 දෙනෙකුගෙන් රු.3,385,312 ක නිවාස ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. කෙසේ වෙතත්, අදාළ නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 1981 අංක 75 දරණ උක් පර්යේෂණ පනතේ 3 වන ජේදයේ (ඊ)උප වගන්තිය මඟින් ලබා දී ඇති බලතල අනුව සේවක සුබසාධක පහසුකම් යටතේ මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇති බව, ණය යෝජනා ක්‍රමය ආයතනයේ පාලක මණ්ඩලය අනුමත කර ඇති බව සහ ණය මුදල් වාරික වශයෙන් අය කරන බව. | අදාල පනත ප්‍රකාරව අනුමත අරමුදලක් ගොඩනගා සුභ සාධන පහසුකම් ක්‍රියාත්මක කළ යුතු අතර මහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන ණයයෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 1981 අංක 75 දරන උක් පර්යේෂණ ආයතන පනතේ 3 වන ජේදයේ (ඊ) උප වගන්තියට අනුකූල නොවන ලෙස, සුභසාධන අරමුදලක් ස්ථාපිත නොකර නිළධාරීන්/සේවකයින් 62 දෙදෙනෙකු සඳහා මාසික කුලී අයකිරීමකින් තොරව රජයේ නිවාස ලබාදී තිබුණි. තවද, එම නිවාස සඳහා ජල මනු සවිකර නොතිබූ අතර, ආයතනයේ ප්‍රධාන ජල සැපයුම මගින් එම නිවාස වෙත ජලය සපයා අදාළ පෞද්ගලික ජල බිල්පත් භාණ්ඩාගාර අරමුදල් මගින් පියවා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී එම නිවාසවල විදුලි ගාස්තු වෙනුවෙන් රු.1,037,236ක භාණ්ඩාගාර අරමුදල් වැය කර තිබුණි | 1981 අංක 75 දරණ උක් පර්යේෂණ ආයතන පනතේ 3 වන ජේදයේ (ඊ) උප වගන්තිය මගින් ලබාදී ඇති බලතල අනුව පාලක මණ්ඩලයේ අනුමැතිය මත මෙම විදුලිය නිල නිවාස සඳහා සීමිත ඒකක ගණනක් අය කිරීමකින් තොරව සේවක සුබසාධනය අරමුණු කරගෙන ලබා දෙන බව. | පනතේ ප්‍රතිපාදන අනුව අනුමත සුභසාධන අරමුදලක් ස්ථාපිත කර, එම අරමුදල හරහා අනුමත සුභසාධන පහසුකම් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාර්ය මණ්ඩලය වෙත ණය පහසුකම් ලබාදීම සඳහා කාර්ය මණ්ඩල චක්‍රීය ණය අරමුදලක් පිහිටුවා, ඒ සඳහා රාජ්‍ය බැංකුවක ඉතුරුම් ගිණුමක් සහ ජංගම ගිණුමක් විවෘත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම බැංකු ගිණුම්වල රු.4,564,462ක මුළු ශේෂයක් පැවති අතර, අදාළ ණය අරමුදල පිහිටුවීම, ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් යොදා ගැනීම සහ බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | කාර්ය මණ්ඩලයට ණය ලබා දීම සඳහා ණය අරමුදලක් පිහිටුවා එමඟින් ණය මුදල් ලබා දීම සඳහා උඩවලව මහජන බැංකුවේ ජංගම ගිණුමක් හා ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීමට 2007 මැයි මස 28 වන දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බව. | මහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන අදාළ ණයෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීනි නිෂ්පාදන ආයතන 04 කින් ලැබිය යුතු රු.6,319,136ක මුදලක් වසර 02 ක සිට වසර 05 ක කාලයක් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට නිරන්තර සිහි කැඳවීම් නිකුත් කරන බව සහ රේඛීය අමාත්‍යාංශය මගින්ද අදාළ මුදල් කඩිනමින් නිරවුල් කරන ලෙස ඉහත දක්වන ලද සීනි සමාගම් වෙත දැනුවත් කර ලිපි ඉදිරිපත් කර ඇති බව. | අක්‍රීය ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.55,327,592ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,221,723ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,105,869 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවීම මෙම ඌනතාවයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්තලේ සීනි කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමේ අරමුණින්, ඊට අවශ්‍ය බීජ උක් සැපයීම සහ ප්‍රදේශයට සුදුසු උක් ප්‍රභේද තෝරා ගැනීම ඇතුළු පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 2011 වර්ෂයේදී කන්තලේ සීනි කර්මාන්තායතනය සතු ඉඩම්වලින් අක්කර 400ක භූමි ප්‍රමාණයක් සහ ගොඩනැගිලි 13ක් උක් පර්යේෂණ ආයතනය වෙත ලබාදී තිබුණි. එම | එම මධ්‍යස්ථානය වසා දැමීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා අමාත්‍යාංශයෙන් ලිඛිත ඉල්ලීම් සිදුකර තිබෙන බව. | මෙම මධ්‍යස්ථානය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව නැවත සමාලෝචනය කර, එහි පවතින වත්කම් ඵලදායී හා ආර්ථිකමය ලෙස |

| | | |
|---|---|---|
| කටයුතු සඳහා ආයතනය විසින් 15 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර, 2011 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වසර 14ක කාලය තුළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මිලියන 157.1ක් වැය කර තිබුණද, කන්තලේ සීනි කර්මාන්තායතනය ආරම්භ නොකිරීම හේතුවෙන් එම වියදම් මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | | භාවිත කිරීමට හෝ විකල්ප ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ වෛද්‍යාධාර දීමනා උපරිම සීමාව සම්පූර්ණයෙන්ම භාවිත කර තිබූ නිලධාරීන් 84 දෙනෙකු වෙත, එම වර්ෂයට අදාළ වෛද්‍ය බිල්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් රු.1,714,438ක මුදලක් ප්‍රතිපූරණය කර තිබුණි. ඒ අනුව, අදාළ නිලධාරීන් සඳහා අනුමත වෛද්‍යාධාර සීමාව ඉක්මවා ගෙවීම් සිදුකර තිබුණි. | වෛද්‍යාධාර බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ එක් කොන්දේසියක් වන්නේ මසක් තුළ ඉදිරිපත් කරන බිල්පත් සඳහා ගෙවීම් කිරීම බව, මෙම ගෙවීම් කිරීම ඉදිරි වර්ෂ 02ක කාලය සඳහා නීත්‍යානුකූල වන බව සහ පූර්ව වර්ෂයේ ඉදිරිපත් කර ඇති, මුල් ශේෂ ඉතිරි වී නොමැති බිල්පත් සඳහා 2025 වර්ෂයේ ගෙවීම් කර ඇති බව. | රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | නිලධාරීන් 08 දෙනෙකු වෙත ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද වෛද්‍යාධාර දීමනා ශේෂය ඉක්මවා, ඉකුත් වර්ෂයට අදාළ බිල්පත් මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු.145,484ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | රෝහල් ගතවූ වෛද්‍යාධාර බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ දී පසුගිය වර්ෂ 02ක ශේෂ වලින් සමාලෝචිත වර්ෂයේ ගෙවීමට හැකි බවට කොන්දේසියක් පවතින බැවින් ඒ අනුව මෙම ගෙවීම් සිදු ර ඇති බව. | රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් භාණ්ඩාගාර උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පොල් ඵලදාව නෙලීමේ ආදායම එක් මුරයකට අදාළව පමණක් වාර්තා කර තිබුණි. ඒ අනුව, වාර්තා නොකළ මුර 03කට අදාළව අවම වශයෙන් පොල් ගෙඩි 6,000කින් පමණ ලැබිය යුතු රු.780,000ක පමණ ආදායමක් (පොල් සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත මිල ගණන් මත පදනම්ව) වාර්තා කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී නෙළන ලද පොල් ගෙඩි 2,535ක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියකින් තොරව, ගෙඩියක් රු.15 බැගින් ආයතනයේ නිලධාරීන් වෙත ලබාදීම හේතුවෙන් රු.329,550ක ආදායම් අහිමි වීමක් සිදුව තිබුණි. | මෙම පොල් ගස් වාණිජ වගාවක් ලෙස නඩත්තු නොකරන බව, පොල් ගස් මයිටා උවදුරට ලක්වීම, පොහොර/කෘමිනාශක යොදා නොමැති වීම හේතුවෙන් පොල් ඉතා කුඩා ප්‍රමාණයේ ඒවා වන එබැවින් වෙළඳපොළේ අලෙවි කිරීමට කටයුතු කර නොමැති බව, ඵලදාව සේවක සුබසාධක කටයුත්තක් ලෙස සලකා සේවකයන් අතර රු.15 ක නාමික අගයකට ලබා දී ඇති බව සහ වර්ෂයට වාර 04ක් අස්වැන්න ලබා ගැනීමට තරම් ඵලදාවක් නොමැති | රජයේ වත්කම් හා ඒවායින් ලැබෙන ඵලදාව විධිමත් ලෙස වාර්තා කර, ඒවා කාර්යක්ෂම හා ඵලදායී ලෙස කළමනාකරණය හා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

බැවින් 2025 අගෝස්තු මාසයේ පමණක් පොල් අස්වනු නෙලීම සිදු කරන ලද බව.

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ පාලක මණ්ඩලය පත්කිරීමේ ප්‍රමාදය හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අදාළ නිලධාරීන් වෙත මූල්‍ය බලතල පැවරීම සමාලෝචිත වර්ෂයේ ජුනි 16 දින දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිට ජුනි 15 දින දක්වා කාලය තුළ විධිමත් අධිකාරි බලතල පැවරීමකින් තොරව මූල්‍ය පාලන කටයුතු සිදුකර තිබුණි. | 2025 වර්ෂ ආරම්භයේ 2024 වර්ෂ අවසානයේ පාලක මණ්ඩලය පත් නොවීම හේතුවෙන් පරිපාලන කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට බලතල පැවරීම පිළිබඳ අනුමැතිය කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් 2024 දෙසැම්බර් 19 දින ඉල්ලුම් කර ඇති බව සහ 2025 මැයි මස අවසානයේදී පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඒ අනුව මූල්‍ය බලතල පවරා ඇති බව. | ගිණුම් වර්ෂය ආරම්භ වීමට පෙර මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අදාළ නිලධාරීන් වෙත විධිමත් ලෙස මූල්‍ය බලතල පැවරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අනුව, රු.15,586,298ක හිඟ සෙස් බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග තීරණය කර නොතිබුණි. | ලැබිය යුතු සෙස් මුදල් අය කර ගැනීමට නිරන්තර සිහි කැඳවීම් සිදු කරන බව සහ රේගුව අමාත්‍යාංශය මගින්ද අදාළ මුදල් කඩිනමින් නිරවුල් කරන ලෙස සිහි සමාගම් වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | හිඟ සෙස් බදු මුදල් අය කර ගැනීමට පාලක මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග තීරණය කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් ඉකුත් වර්ෂවලදී නිෂ්පාදන කටයුතු අවසන් කර තිබුණු ශාක පෝෂක (පොහොර) නිෂ්පාදනයක් සහ පළිබෝධනාශක නිෂ්පාදන 05 ක් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම නව නිෂ්පාදනය සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට අයදුම් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද බව, වර්තමානය වන විට ආයතනික ව්‍යාපාර සම්බන්ධතා ඒකකයේ කටයුතු තාවකාලිකව නැවතී ඇති බැවින්, ඒ හරහා සිදුවෙමින් පැවති පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය ද මේ වන විට අඩාල වී ඇති බව. | නිෂ්පාදන සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කර, ඒවායේ බුද්ධිමය දේපළ අයිතිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 40ක ප්‍රාග්ධන ප්‍රදාන අයවැයගත කර තිබූ අතර, ඉන් රු.මිලියන 24ක් පමණක් 2025 නොවැම්බර් මාසයේදී ලැබී තිබුණි. එමඟින් සැලසුම් කර තිබූ ප්‍රාග්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම හේතුවෙන් ලැබුණු ප්‍රතිපාදනවලින් රු.12,905,803ක් හෙවත් සියයට 54ක් වැය නොකර භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි. | පාලක මණ්ඩලය පත්කිරීම ප්‍රමාද වීම, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම, ප්‍රාග්ධන ප්‍රතිපාදන 2025 නොවැම්බර් දක්වා ප්‍රමාද වීම මේ සඳහා හේතු වී ඇති බව. | වියදම් දැරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි අග්‍රිමය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිකිරීම් කර්මාන්ත 30 ක් සඳහා බාහිර පාර්ශව වෙත ගාස්තු ගෙවා ඇස්තමේන්තු සකස් කරවා ගෙන තිබුණි. ඒ අතරින් 2021 වර්ෂයේ දී මහවැලි අධිකාරියේ ලිපි ශීර්ෂ භාවිතා කරමින් ඉදිකිරීම් කර්මාන්ත දෙකක් සඳහා එකතුව රු.24,411,265ක ඇස්තමේන්තු සකසා ඉදිරිපත් කළ මහවැලි අධිකාරියේ නිලධාරියෙකු වෙත, ඇස්තමේන්තු සැකසීමේ ගාස්තු ලෙස රු.976,425ක් ඔහුගේ පුද්ගලික ගිණුමට බැරවන පරිදි ගෙවා තිබුණි. එහෙත්, එම ඇස්තමේන්තු දෙකට අදාළ ඉදිකිරීම් කටයුතු 2026 මාර්තු 13 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවත් ඉදිකිරීම් කර්මාන්ත 20 ක් සඳහා බාහිර පුද්ගලයින් දෙදෙනෙකු සහ එක් ආයතනයක් වෙතින් එකතුව රු.33,704,917ක ඇස්තමේන්තු සකස් කරවා ගෙන ඒ සඳහා රු.621,456ක් ගෙවා තිබුණ ද, එම ගාස්තු ගෙවීමේ පදනම සහ ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රු.976,425ක මුදල ඔහුගේ පෞද්ගලික ගිණුමකට ගෙවා ඇති බව විගණන නිරීක්ෂණය මත පදනම්ව හඳුනා ගත් පසුව එම මුදල මහවැලි අධිකාරිය වෙත නැවත අයකරගෙන ඇති බව, දෙණියාය උප මධ්‍යස්ථානයේ ඉඩම සම්බන්ධව ගැටළු පවතින බැවින් සියළු ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දමා ඇති බව, ලියාපදිංචි සේවා සැපයුම්කරුවන් 02ගෙන් අදාළ ඉංජිනේරු සේවාව සෘජුවම ලබා ගෙන, ඒ වෙනුවෙන් ගෙවිය යුතු මුදල් ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇති බව | විධිමත් අනුමැතියකින් තොරව බාහිර පුද්ගලයන්ට සහ ආයතන වලට රාජ්‍ය මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු අතර රජයට සිදුව ඇති අලාභය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අයකර ගැනීම් සිදුකළ යුතුය. |
| (ආ) | දෙනියාය උක් බීජ අභිජනන මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය, රැඳවුම් බැම්ම සහ ගේට්ටුව ඉදිකිරීම සඳහා වැඩ විෂයයන් 15ක් ඇතුළත් කර රු.1,285,930ක ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර, ඇස්තමේන්තුව සකස් කිරීම වෙනුවෙන් බාහිර පුද්ගලයෙකු වෙත රු.19,289ක ගාස්තුවක් | කොන්ත්‍රාතුවේ මූලික ඇස්තමේන්තුවේ සඳහන් නොවූ ඉතා අවශ්‍ය වැඩ කොටස් සිදු කිරීම සඳහා එවකට ආයතනයේ නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අදාළ වැඩ කොටස් එම කොන්ත්‍රාත්කරු මගින්ම සිදු කිරීමට උපදෙස් ලබා ඇති | නිසි අනුමැතියකින් තොරව සිදුකර ඇති ගෙවීම් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් පිළිබඳව |

| | | |
|---|---|---|
| ගෙවා තිබුණි. කෙසේ වෙතත්, අනුමත ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ වැඩ විෂයයන් 09ක් සඳහා නිසි අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත රු.1,041,165ක් ගෙවා තිබුණි. තවද, සම්මත මිල ගණන් භාවිතයෙන් තොරව වැඩ විෂයයන් 02ක් සඳහා රු.263,603කින් වැඩිපුර ගෙවා තිබූ අතර, එම අමතර වැඩ සඳහා සිදුකළ ගෙවීම්තුල වෙනත් කර්මාන්තයකට අදාළ වැඩ විෂයයන් 03ක් වෙනුවෙන් කළ රු.51,000ක ගෙවීමක්ද ඇතුළත් කර තිබුණි. | බව, වෙනත් සිවිල් ඉංජිනේරුවකු විසින් එම වැඩ කොටස් වෙනුවෙන් රු.1,492,466ක මුදලක් නිර්දේශ කර ඇති බව, පසුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තාක්ෂණික නිලධාරියකු සහිත තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් නිර්දේශිත මිලගණන් අනුව පාලක මණ්ඩලයේ අනුමැතිය මත රු.1,041,165ක මුදලක් ගෙවීම් කිරීමට කටයුතු කර ඇති බව සහ මුල් කොන්ත්‍රාත්තුවේ සඳහන් නොවී තිබූ වැඩ කොටස් 3 ක් වෙනුවෙන් ද රු.51,688ක මුදලක් තාක්ෂණික ප්‍රසම්පාදන කමිටු නිර්දේශ සහ අනුමැතිය මත ගෙවීම් කිරීමට කටයුතු කර ඇති බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර, වැඩිපුර ගෙවා ඇති මුදල් සම්බන්ධයෙන් වගකීම තීරණය කර රජයට සිදුව ඇති මූල්‍ය අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු ඉකුත් වර්ෂයේ සිටද, අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ හුවමාරු) තනතුර 2020 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවති අතර, ප්‍රධාන තාක්ෂණ හුවමාරු නිලධාරී, ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 05ක් සහ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික හුවමාරු නිලධාරී තනතුර යන තනතුරු 10ක් ඇතුළු තනතුරු 80ක් පුරප්පාඩුව පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී) තනතුර සහ නියොජ්‍ය අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු ඉකුත් වර්ෂයේ සිටද, අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ හුවමාරු) තනතුර 2020 වර්ෂයේ සිටද, ප්‍රධාන තාක්ෂණ හුවමාරු නිලධාරී තනතුර, ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 05 ක් සහ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික හුවමාරු නිලධාරී තනතුර යන තනතුරු 10ක් ඇතුළු තනතුරු 80ක් පුරප්පාඩුව පැවතුණි. | ආයතනයේ කාර්යසාධනය හා කාර්යක්ෂමතාවයට බලපාන අත්‍යවශ්‍ය තනතුරු හඳුනාගෙන, එම තනතුරු කඩිනමින් පුරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |